




සිසිර දිසානායක

# යකඩ යකා



**අපගේ අත්දැකීම් කෙතරම් අකාරුණික වුව ද අපි ඒ අතීතය විඳිමින් සිටින්නෙමු. ඇතැම් විට අතීතය මේ ජීවිත කාලය තුළදීම පෙරළා පැමිණෙයි. ඒ අප ලබා උපන් සැටිය ද ?**

"මහ හයියෙන් හූ කිය කිය
"හොස් " ගාලා දුම් දම දම
අඟුරු කකා වතුරු බි - බී
මා දුවන්නෙ පීලි දිගේ "

"දිනපතා ම යාපනයට
රුහුණු රටට කඳුකරයට
බඩු ගොඩකුත් පටවාගෙන
මිනිසුන් ගෙන යන්නෙ මමයි !"

"පුංචි ළමයි මට ආසයි
ඒත් ළගට එන්න බයයි
ඒ වුණාට පේළි සැදී
කෝච්චියක් වාගේ යයි !"

උදේ පාන්දරම පන්හිඳට පුංචි කාලෙ කිව්ව කවි පෙළක් මතක් වෙලා. කවුරු හරි හිතවතෙක්, නෑයෙක් ගෙදරට ආවම තාත්තා පන්ට සින්දුවක් කියන්න කියනවා. ඒ කාලේ පන්ට කියන්න තිබුණෙ අම්මා කියලා දුන්න ඔය කවි පෙළ විතරමයි.

"හරි පුදුමයි ! මෙලෝ දෙයක් මතක් හිටින්නැති පන්ට කවි පෙළනම් මතකයෙන්ම කියවුණා...." පින්සල අනික් ඇඳේ ඉඳගෙන. සෙනසුරාදා දවස හන්දා ටිකක් පමා වෙනකල් නිදියා ගන්න හිතාගෙන හිටපු පින්ට ඇහැරුණෝ පන්ගේ කවි ගායනය හන්දා. මුකුත් කියන්නත් විදියක් නෑ. පන් කවි ගායනය කලේ පින්සලටයි, පැන්සලටයි දෙන්නාට ම තේ හදන ගමන්. තාලයට සීනි දිය කරන ගමන්.

"දැන් දැන් ඔළුවට එක්වෙන දේවල් මතක හිටින්නෙ නැතිවට පොඩි කාලෙ දේවල් අදටත් මකක තියෙන එකනම් පුදුමයි තමා....." පැන්සලත් ඇඳේ හරිබරි ගැහිලා වාඩි වුණෝ තේ එක ඇඳටම ලැබෙයි කියලා වෙන්න ඇති.

පුංචි කාලෙ ඉඳන්ම එකට සෙල්ලම් කරපු, ඉස්කෝලෙ ගිය තුන්දෙනාට ම මේ කවිය අහලා තමන්ගෙ ගම් පළාත මතක් වුන එක ගැන පුදුම වෙන්න දෙයක් නෑ.

තුන්දෙනාගෙ ම ගෙවල් තිබුණෝ පොඩි කඳු ගැටයක. ඒ කඳු ගැටයේ දෙකෙන් පංගුවක් විතර වටේට ගිහින් තමයි ඕපනායකට දුවපු පුංචි කෝච්චිය ගියේ. ඒ නිසා "හූ" කියාගෙන දුවපු මේ කළුම කළු යකඩ යකා මේ අයට එක්කරන්නේ සුන්දර මතකයක්.

රේල් පාර ජීවිතයේ කොටසක් වෙලයි තිබුණේ ඒ දවස්වල. කොහේ ගියත් කෙටි ම පාර වුණෝ රේල් පාර. උදේට ඉස්කෝලේ යන්න මේ අයව කීද්දුවේ කුකුලන් හඬලන්නටත් කලියෙන් "හූ" කියපු කෝච්චිය.

"පිනි බර යාමේ සැවුලන් හඬලනවා
අම්මා වටකර ලිප ගිනි නැළවෙනවා
කොළඹ රේල්ලුව රජ ගමනට එනවා
නැගිටින් පුතුනේ බිම් මල් හිනැහෙනවා"

ලූෂන් බුලත් සිංහල මහත්තයා ලියපු පද පෙළ විකටර් රත්නායක මහත්තයා ලියපු පද පෙළ වික්ටර් රත්නායක මහත්තයා හදලා දීලු තාලෙට කියන්න පින්සල උත්සාහ කළා. ඒත් මුලින් ගායනාව කරපු සුනිල් එදිරිසිංහ මහත්තයාට ගෑවෙන්න පුළුවන්ද ?

මේ සින්දුවේ තියෙන්නෙත් පන්, පින්, පැන් තුන්දෙනාගේ ගමේ පරිසරය. තුන්දෙනා අනික කොලු රෑනට වැටිලා සෙල්ලම් කළේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති පරණ ඉඩම් කෑල්ලක. සිල්පර කොට උඩ පීලි දමපු ඒ ඉඩම් කෑල්ලේ ක්‍රිකට් ගැහුවෙ කොහොමද කියලා අදටත් හිතාගන්න බෑ. උඩ පන්දු රැකගන්න අහසට නැගපු පන්දුව දිහා බලාගෙන මේ රේල් පීලි සිල්පර උඩින් දිව්ව විදියට මේ තරමින් අත - පය බේරිලා තියෙනවා ඇති. තණ තිල්ල වුණෝ රේල් පාරවල් දෙකක් අතර හිස් කොටස.

"මතකද අපේ ගෙවල්වලට එහා රේල් පාරේ තිබුණ සිග්නල් කණුව ?" පැන්සල මතක් කළා. රෑට ඕක උඩ ලාම්පුවක් තියනවා. අනික් පැත්තට වෙන්න මහ පාර හරහා රේල්පා යන තැන තියෙන ගේට්ටුව වහලා සිග්නල් එක දාන්න හිටපු මනුස්සයා තමා රෑට ඔය ලාම්පුව තියන්න සිග්නල් කනුවට නගින්නෙ. ඔය ඉණිමග දිගේ දවල් වෙලාවට මාත් නැගලා බලනවා." පැන්සල තමන්ගේ මතකය ඇවිස්සුවා.

"මාත්.....!" පින්සලත් එකතු වුණා. ඒත් උඩට නැග්ගම ඈත කඳු යායටත් ඉහළින් සිරි පාදේ කන්ද පේනවා අපූරුවට. මට මතකයි මං ඔය දර්ශනය අඳින්නත් උත්සාහ කළා." ඒ පින්.
"කෝච්චිය රේල් පාරවල් ඉස්ටේෂමේදී මාරු කරන්නෙ කොහොමද, කෝච්චියේ රෝද ඒ වැඩේට ගැලපෙන්න හදලා තියෙන්නෙ කොහොමෙද කියන එ කමං තේරුං ගත්තෙ හතරේ - පහේ පන්තිවල ඉන්න දවස්වලමයි." පැන්සල තාක්ෂණය පැත්තට උනන්දු වෙලා තියෙන්නේ ඒ කාලෙ ඉඳන්ම යි එහෙනං ?"

"මතක ද රේල් පීලි දිගේ සමබර වෙලා දුරට ඇවිදගෙන ගියා ? සමහර විට දෙන්නෙක් පීලි දෙකේ ඇවිදගෙ ගියේ අත් අල්ලගෙන. පුංචි කෝච්චි පාර පළල් නැති හන්දා එහෙම කරන්න පුළුවන් වුනා. සිල්පර කොටන් සිල්පරෙ කොටේට පැ පැන අපි කොයි තරම් දුර ගිහින් ඇද්ද ?" පන්හිඳත් තමන්ට දැනු මතකය කියෙව්වා.

"සිග්නල් දාන හැටි, රේල් පීලි වෙනස් කරලා කෝච්චිය වෙන පාරකට හරවන හැටි, පෙට්ටි අමුණන හැටි, බඩු පෙට්ටිවල බඩු පටවන - බාන හැටි.... මතකද ? ඒ පැන්සල. "ඒ ඉතින් ඉස්ටේසමේදී අපි දැක්ක දේවල්නේ."

මේ කෝච්චි මතක අතරේ උදේ කෑම වේලත් නොදැනීම වගේ පිළියෙල වුණා. පුංචි කාලෙ අපි කාගෙ වුණත් හිතට එකතු වෙන මතකය හොඳට රැඳෙනවා. ඒ මතක කොයි තරම් අමිහිරි, අවලස්සන දේ වුණත් ඒවා දැන් සුන්දරයි. පන්හිඳට හිතුනා. පන්හිඳ සන්නසට ලියන්න හිතුවා යමක්.

කුඩා වියේ අප ලබනා අත්දැකීම් ඇසුරින් මතකයට එක්වන දේ ජීවිතය පුරාවට ම රැඳී තියෙයි. ඒ අත්දැකීම් කෙතරම් කඨෝර වුව ද ඒවා පසු කලෙක දී අප සිහිපත් කරන්නේ කිසියම් අපූර්වත්වයකින්. ජුගුප්සාජනක අත්දැකීම් ලබන දරුවකුගේ අනාගතයට ඒවා අහිසි ලෙස බලපාන බැව් නොකිව මනා ය. එසේ වුවද වැඩිහිටියන් ලෙස පසු කලෙක අප කරනා තක්සේරුව නිර්ව්‍යාජ වේ ද ?

පසුගිය දිනවල සිනමාහල්වල ප්‍රදර්ශනය වූ "ලයන් " සිනමා පටය අප හට කදිම පාඩමක් කියා දෙයි. සරූ බ්‍රයර්ලි ˜ිරදද ඊරසැරකැහ* විසින් රචිත "ලයන් " නවකතාවේ සිනමා පටයටත් වැඩි යමක් අපහට කියා දෙයි. පස්වැනි වියේ ඉන්දියාවේ පිටිසර පළාතකදී අවතැන් වන "සරූ"˜ිරදද* තමාව තස්මේනියාවේ බ්‍රයර්ලි :ඊරසැරකැහ* යුවල විසින් දරුකමට හදාගැනීඹට යොමු වූ සැටියත් වසර විසි පහකට පසු ගූගල් වෙබ් අඩවියේ චන්ද්‍රිකා සේයා සිතියම් අනුව සිය මව සොයා ගිය සැටිත් මෙම සිනමා පටයෙන් කියැවෙන කතාවයි. එහෙත් නව කතාව කියැවීමේදී ස්ඵුට වන ප්‍රධානම කාරණය නම් තොරතුරු තාක්ෂණය අබිභවා ගිය සරූගේ මතක ශක්තියයි. පස්වැනි වියේදී තමන් එතෙක් හැදී වැඩුන පරිසරය පිළිබඳව මතකයේ රැඳී කරුණු "ගූගල් සර්ච්" යාන්ත්‍රණයෙන් විපුල පළ නෙළා ගැනීමට ප්‍රධාන සාධකය වූ සැටිය සරූ තමන්ගේ මනෝභාවයන් පිළිබඳව දිගින් දිගටම කරන විස්තරයෙන් තහවුරු වෙයි. මව සොයා යාමේ අප්‍රතිහත ධෛර්යය සහ උනන්දුවද එක් වූ සේය.

තස්මේනියාවේ ඉසුරුමත් පවුලක හැදී වැඩුනද සරූ සිය ගමට තවමත් ඇළුම් කරයි. සුදු යුවළක් ඇසුරේ සිටිය ද කුලී වැඩ කරමින් ජීවිකාව ගෙන ගිය සිය මව ඔහුට ලොව වඩාත්ම "ලස්සන" කාන්තාවයි. මේ ඔහු කුඩා වියේ ලද මනෝභාවයන් නොවේ ද? දුම්රිය මැදිරියක අතරමං වූ ඔහු වසර විසි පහකට පසුව සිය වියදමින් ඒ අත්දැකීම විඳගනීයි. ඒ කටුක අත්දැකීම පසු කලෙක ඔහුට සොඳුරු මතකයක් වූ නිසා නොවේ ද ? අපගේ අත්දැකීම් එතරම් කටුක නොවේ. ශමව් බිමේ පරිසරය වැඩිහිටියන්, සමාජය සරූගේ අත්දැකීම් තරමටම අකාරුණික නොවේ. එසේ අකාරුණික වුව ද ඒ ඉතා සුළුතරයකට විය හැකිය.

අපගේ අත්දැකීම් කෙතරම් අකාරුණික වුව ද අපි ඒ අතීතය විඳිමින් සිටින්නෙමු. ඇතැම් විට අතීතය මේ ජීවිත කාලය තුළදීම පෙරළා පැමිණෙයි. ඒ අප ලබා උපන් සැටිය ද ?

පන්, පින්, පැන් තුන්දෙනා ඕස්ට්‍රේලියාවේදීත් වැඩට යන්නේ කෝච්චියේ. පන් මේ ලිපිය සන්නසට ලියලා ඉවර කළේත් කෝච්චියේදී. ඉතින් තවත් මොනවද මේ කතා ?